# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2331/15 – 2023 මැයි මස 09 වැනි අඟහරුවාදා – 2023.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2019 මැයි මස 08 වැනි දින අංක 2122/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2019 අංක 88 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/7/2018/HW/392.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 4/1/1/32-K.
2023 අප්‍රේල් මස 10 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 836, කුරුණෑගල නගරය, තෙලියාගොන්න ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තෙලියාගොන්න ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක කු 2445 හා 2019.12.03 දිනැති මූලික පිඹුරේ සවිස්තරව පෙන්නුම් කර ඇති පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 9 – බොක්කාවෙල කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0338**

උතුරට: ඒ. එස්. කරීම් හිමිකම් කියන කරඳගහ කුඹුර; නැගෙනහිරට: ඒ. එස්. කරීම් හිමිකම් කියන කරඳගහ කුඹුර සහ මු.පි.කු. 2366 හි කැබලි අංක 10 සහ 11; දකුණට: මු.පි.කු. 2366 හි කැබලි අංක 11 සහ මෙම පිඹුරේ කැබලි අංක 10; බටහිරට: කැබලි අංක 10, 11 සහ ඒ. එස්. කරීම් හිමිකම් කියන කරඳගහ කුඹුර.

EOG 05 – 0037

1A – G 039434 – 19 (2023/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*